දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி ) 0112698507,0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXI/01/2025

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2025/03/07
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media

**පොදු චක්‍රලේඛ ලිපි අංක :-** 02-25/2025

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ.

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර.

අධ්‍යක්ෂ - ජාතික රෝහල, ගාල්ල.

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ( MT - 05 ) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාල පවුල් සෞඛ්‍ය සේවාවේ II "ආ" ඛණ්ඩයේ/ III ශ්‍රේණියේ නිලධාරිනියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණිය නිලධාරිනියන් සඳහා, III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2025/04/27** දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම් -**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී II "ආ" ඛණ්ඩයට / III ශ්‍රේණියට පත්වීම් ලද, හා මෙතෙක් එම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරිනියන් පමණි.

**03. අයදුම්පත් -**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගතයුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, අධ්‍යක්ෂ (විභාග), "සුවසිරිපාය", සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 වෙත **2025/03/28** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි " පවුල් සෞඛ්‍ය සේවාවේ II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරිනියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025 "** ලෙස අයදුම්කරන විභාගයෙහි නම සඳහන් කලයුතුය. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපි ගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින්ද, සහතික කර තිබීම අනිවාර්යය වේ. **තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9 × 4 ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතුය**. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකුල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04. විභාග ගාස්තු**

I. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**05. විභාගයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යංශය හෝ ඊට අදාල ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06. විභාග පටිපාටිය**

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති** යනුවෙන් ද **මුදල් රෙගුලාසි** යනුවෙන් ද ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එම එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු **40** ක් ලබාගත යුතු අතර එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය.. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.

**07. විෂය නිර්දේශ මාලාව**

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ**

- ❖ **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේදය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මත සැකසේ.**

IV වන පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලික තත්වය, ස්ථිර තත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම

- ❖ **ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද**

XII වන පරිච්ඡේදය - නිවාඩු

XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර

XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරී ගමන්

XIX වන පරිච්ඡේදය - රජයේ නිවාස

XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය

XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති

- ❖ **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති**

**07.2 මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය තුනකි. රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| I වන පරිච්ඡේදය - | වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු.රෙ 01 සිට මු.රෙ 68 දක්වා) |
| III වන පරිච්ඡේදය - | මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම සහතික කිරීම කාර්ය පැවරීම ( මු.රෙ 124 සිට මු.රෙ 147 දක්වා) |

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.**

**Web Path :- www.health.gov.lk ⟶ Staff Access ⟶ Administration ⟶ Examination ⟶ Circulars**

**ස.යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

**EXI**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම්පත

**<u>සෞඛ්‍ය අමාත්‍යංශයේ ( MT - 05 ) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයට අදාල පවුල් සෞඛ්‍ය සේවාවේ II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරිණියන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025</u>**

**01.** (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්)- ..............................................................................

..............................................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

(ආ) I. මුල් පත්වීමේ දිනය :- ..............................................................................

11 දැනට ලබන වාර්ෂික වැටුප :-..............................................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය :-

1V ජංගම දුරකථන අංකය :-

V විද්‍යුත් ලිපිනය:- ..............................................................................

**02.** ඔබ මෙවර පෙනීසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ☐ මුදල් රෙගුලාසි ☐

**03.** (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන්..............................................................................

ඉංග්‍රීසියෙන් ..............................................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..............................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..............................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ..............................................................................

(ඊ )1. තැපැල් ලිපිනය (සිංහලෙන්) - ..............................................................................

..............................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..............................................................................

..............................................................................

**04.** විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..............................................................................

**EXI**

05. (අ) මිට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද?..................................................

| මුද්දර කොටුව |
| --- |

---

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට* නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නිති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තිරණයකට මම එකග වන බවත් මෙයින් සහතික කරමි.

දිනය ..........................................  ..........................................
අයදුම්කරුගේ අත්සන

---

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර/ පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් වන මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය :-............................................................  ......................................
නම සහ අත්සන

---

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

........................................................මහතා / මහත්මිය / මෙනවිය .................................. නිළධාරියෙකු වශයෙන් මෙම ආතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත්/ ප්‍රථම වතාවට නොවන බවත්, රු ......... වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද /මුද්දර ඇලවීම අනවශ්‍ය බවද, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

..................................................
දිනය :- ....................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

---

09. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

.................................................. මහත්මිය / මෙනවිය*, .............................. නිලධාරිනියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ........................  ..........................................
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)